


LAW & SOCIETY TRUST

# ප්‍රජාතන්ත්‍රවාදී සංවාදය, ක්‍රියාකාරී සවන්දීම සහ පුරවැසි සහභාගිත්ව අන්තර්ගතය: වසංගත සහ සමාජ අර්බුද අවස්ථාවන්හීදී පුරවැසි සහභාගිත්වය අන්තර්ගත කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව මුහුණපානු ලබන වසංගත සහ සමාජ- ආර්ථික අර්බුද අතරතුර පුරවැසි සහභාගිත්වය ඇති කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, නීතියේ ආධිපත්‍යය සහ මහජන වගවීම ශක්තිමත් කිරීමයි. වගකිවයුතු පුරවැසියන් ලෙස අපි ව්‍යාවස්ථානුකූලභාවය පිළිබඳ මූලධර්ම හා බැඳුණු අර්බුදයන්ට රජය විසින් ප්‍රතිචාර දැක්වීම තහවුරු කර ගැනීමට සහ රජය විසින් විශේෂයෙන් වැරදි තොරතුරු සහ වෛරී අදහස් හුවමාරු වීම වැළැක්වීම තහවුරු කිරීමට මෙන්ම වෙනස්කම් සිදු කරන්නන්ගේ සහ බලපෑම් ඇති කරන්නන්ගේ ධනාත්මක මැදිහත්වීම තුළ සමාජ සහයෝගීතාව ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙමු.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, ව්‍යාපෘතිය මඟින් සෞඛ්‍යය සහ ආර්ථික අභියෝග සඳහා රජය විසින් ලබා දෙන වේගවත් ප්‍රතිචාර විශ්ලේෂණය කිරීම සඳහා නිල නොවන "පුරවැසි විමසුමක්" ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රතිපත්ති ගැටලු සඳහා මහජන කථිකාවක් ප්‍රවර්ධනය කිරීම, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීම; ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් වලට බලපෑම් කරන අන්දමින් පැනනඟින ගැටලු වලට පුරවැසියන්ට කාලෝචිත සහ සාධක හේතු කරගත් තොරතුරු සැපයීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත් කිරීමට මෙන්ම පුරවැසියන් හට පශ්චාත්- වසංගත සන්දර්භය තුළ තමන්ගේ අවශ්‍යතාවන්, උද්වේගයන් සහ අපේක්ෂාවන් ගෙනහැර දැක්වීමට හැකිවන අවශ්‍යතා ඇගයීමක් දියත් කිරීමට බලාපොරොත්තු වෙයි.

මෙම වාර්තාව ලියා ඇත්තේ ළමා ආරක්ෂක බලකායේ (ගරන්ටි ලිමිටඩ්) ශ්‍රී ලංකා හි නිර්මාතෘ නීතිඥ මිලානි සල්පිටිකෝරල මහත්මිය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා දායකත්වයක් ලෙසයග නීතිය හා සමාජ භාරය විසින් ඔවුන් මෙම ව්‍යාපෘතියට සම්බන්ධවීම අගය කරනු ලබයි. ලිපිය තුළ දක්වා ඇති අදහස් කිසිසේත්ම නීතිය හා සමාජ භාරයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ කළමනාකාරීත්වයේ අදහස් පිළිඹිබු නොකරයි.

**පිටකවරය නිර්මාණය: සංගීත් මදුරාවල විසිනි**

# මෙම වසංගතය අතරතුර දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ කෙසේද යන්න ගැන අපි කතා කරමු

## *හැඳින්වීම*

ශ්‍රී ලංකාවේ නීතිය මගින් සහ අන්තර්ජාතික සම්මුති මගින් සහතික කර ඇති ළමයින්ගේ අයිතිවාසිකම් කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් විවිධ ආකාර වලින් උවදුරට ලක් වී ඇත. මෙරට වසංගතයෙහි ග්‍රහණයට හසුවීමත් සමග මිනිසුන්ට තම නිවෙස්වලට ම සීමා වී සිටීමට සිදු විය. මෙම තත්වය සහ ඒ හා බැඳුණු අනෙකුත් අභියෝග වූ රැකියා අහිමි වීම සහ ආදායම් බිඳ වැටීම, මූලික සම්පත් වෙත ප්‍රවේශ වීමට නොහැකි වීම වැනි තත්වයන් පවුල් තුළ අමතර පීඩාවන් නිර්මාණය කර තිබේ. දෙමව්පියන් සහ රැකවරණය සපයන්නන් තමන්ට ඇතිවූ ඉච්ඡාභංගත්වය තම දරුවන් සහ කලත්‍රයන් හෙවත් සහකරුවන් මත පිටකර හැරියහ. ළමයින් නිවෙස් තුළ ම සිරවී සිටි අතර, ඔවුන්ට එම කාලය තුළ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට, මිතුරන් හමුවීමට සහ ව්‍යායාම හෝ ක්‍රීඩා කිරීමට නොහැකි විය. එපමණක් නොව, බොහෝ ළමයින්ට තම පෝෂණ මට්ටම පිරිහී යාමේ තත්වයකට ද මුහුණ දීමට සිදු විය. පවුල්වලට ක්ෂේම භූමියක් විය යුතුව තිබූ නිවහන අපයෝජන බහුල වූ, හුස්ම ගැනීමට පවා අපහසු පරිසරයක් සහිත සිර මැදිරියක් විය.

කෝවිඩ්-19 වසංගතය සියලු ම දෙනා කෙරෙහි කුරිරු බලපෑමක් ඇති කළ අතර, එහි කුරිරුකම වඩාත් ම බලපෑවේ ළමයින් කෙරෙහි ය. වසංගත කාලය තුළ දී ළමයින්ව අපයෝජනයට ලක්කිරීම්වල සීඝ්‍ර ඉහළ යාමක් පෙන්නුම් කරන අතර, ප්‍රතිචාර දැක්වූවන් ගෙන් 76.8% ක් වාචික අපයෝජනයට ලක්වූ බව ද, 7.8% ක් ශාරීරික අපයෝජනයටත් 5.6% ක් ලිංගික හිංසනයටත් ගොදුරු වූ බව ද සමීක්ෂණ ප්‍රතිඵලවල සඳහන් වෙයි. මෙම අපයෝජන වලට වගකිව යුතු වරදකරුවන්ගෙන් 49% ක් ම අසල්වැසියන් බව ද, 25% ක් දෙමව්පියන් බව ද, 24% ක් සමීප සහකරුවන් බව ද සංඛ්‍යාලේඛන මගින් වැඩිදුරටත් පෙන්වා දෙයි. [1]කෙසේ වෙතත්, පවුල් තුළ සිදු වන ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ සිද්ධීන් වලින් බොහොමයක් වාර්තා නොවී පවතින බැවින් මෙම සංඛ්‍යා මගින් ළමා අපයෝජන පිළිබඳ පූර්ණ චිත්‍රය පිළිබිඹු නොකෙරෙන බව ළමා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් දන්නා කරුණකි. එමෙන් ම, පවුල් ඇතුළත සිදු වන ප්‍රචණ්ඩත්වය පිළිබඳ සාකච්ඡා කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධ සංස්කෘතිකමය තහංචි පවතින බැවින්, දිගු කලක් තිස්සේ පවතින හිංසනය සහ අපයෝජනය සම්බන්ධ වඩාත් ම බරපතල ම සිද්ධීන් පමණක් වාර්තා විය හැක. එහෙයින්, කෝවිඩ්-19 වසංගතය කාලයේ දී පවුල් තුළ සිදු වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත ද පරිපූර්ණ නොවේ. එයට අමතරව, රට වසාදැමීම් සමාජ සේවා වෙත ප්‍රවේශ වීම විශේෂයෙන් ම දුෂ්කර බවට පත් කළේය.

## *ශ්‍රී ලංකාවේ 'ළමයා' යන්නෙන් අදහස් වන්නේ කවුද?*

ශ්‍රී ලංකාවේ නීතිවල "ළමයා" යන්නෙහි නිර්වචනයෙන් අදහස් වන්නේද කවුරුන්ද යන්න එකිනෙකට වෙනස් වන බව ආරම්භයේදී ම අවධානයට ගැනීම වැදගත් වේ. *ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි* 1 වැනි වගන්තිය යටතේ දී ඇති නිර්වචනයෙහි "*ළමයෙකු යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු සෑම මනුෂ්‍යයෙක් ම අදහස් වන්නේය*" යන්වෙන් සඳහන් වේ. එසේම, ශ්‍රී ලංකාවේ *2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත* අනුව "ළමයා" යන්නෙන් "*වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තෙක්*" අදහස් කෙරෙයි. එසේ වුවත්, ඇතැම් නීතිවල "ළමයා" යන්න "*අවුරුදු දහහතරට අඩු තැනැත්තෙක්*"

යනුවෙන් නිර්වචනය කර ඇත. දේශීය නීතිය සහ අන්තර්ජාතික නීතිය අතර අනුරූපී බවක් පවත්වා ගැනීම පිණිස මෙම පරිච්ඡේදයේ දී "ළමයා" යන යෙදුමෙන් වයස අවුරුදු අඳහඅටට අඩු පුද්ගලයෙක් අදහස් කෙරෙයි. මෙම පරිච්ඡේදය පුරා ම, ළමයෙකුට හිමි වන සහ නීතිය විසින් ආරක්ෂා කරනු ලබන සියලු ම අයිතිවාසිකම් මෙම පාදීය මට්ටම පදනම් කර ගෙන ආමන්ත්‍රණය කරනු ලැබේ. ආරක්ෂාව, නිවාස, පෝෂණය, අධ්‍යාපනය, බාලවයස්කාර යුක්තිය සහ තවත් දෑ සඳහා ළමයෙක් සතු අයිතීන් මෙයට අයත් වේ.

## *ආරක්ෂාව සහ නිවාස*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(13) වැනි ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාව "ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන් සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සමාජයීය වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ ශුභ සිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කරන"* බවට සහතික වී ඇත. එයට අමතරව, ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය වැනි නීති රාමු මගින් සුරක්ෂිතතාවය සඳහා ළමයින්ට ඇති අයිතිය ආරක්ෂා කරනු ලැබේ. මෙම වටිනාකම රට විසින් ආරක්ෂා කළ යුතු වන මූලික වගකීමක් වන නමුත් එය වසංගත සමය තුළ විශේෂයෙන් අවධානය යොමු විය යුතු අයිතිවාසිකමක් වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පළ කරන ලද "ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ ගෝලීය තත්වය 2020" නැමති වාර්තාව මගින් ළමා අපයෝජන සම්බන්ධයෙන් ළමා උපකාරක සේවා වෙත ලැබෙන ඇමතුම් සංඛ්‍යාවෙහි සීඝ්‍ර ඉහළයාමක් ඇතිවීම පිළිබඳ කනස්සල්ල පළ කර තිබේ. එම ඇමතුම් සංඛ්‍යාවෙහි යම් අඩුවීමක් සිදු වේ නම් එය සැබවින් ම ගෘහස්ථ අපයෝජන සිද්ධීන් සංඛ්‍යාවෙහි සැබෑ අඩුවීමකට වඩා අපයෝජන සිද්ධීන් හඳුනා ගැනීමට ගුරුවරුන් සහ සමාජ සේවකයින් වැනි තුන්වැනි පාර්ශ්ව සතු හැකියාවෙහි අඩුවීමක් හේතුවෙන් වීමට බොහෝ දුරට ඉඩ තිබෙන බව ද එම වාර්තාවෙහි වැඩිදුරටත් සඳහන් කර තිබේ.

2020 වර්ෂයේ මුල් දින 15 තුළ දී ළමා අපයෝජන සිද්ධීන් පනස් හතරකට (54) අධික සංඛ්‍යාවක් වාර්තා වී ඇති බව සඳහන් කරමින් අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු විසින් පාර්ලිමේන්තුව අමතා සිදු කරන ලද ප්‍රකාශය මගින් මෙම කරුණ අනාවරණය කරන ලදී. [2]වාර්තා වන අපයෝජන සිද්ධින් සංඛ්‍යාව සත්‍ය වශයෙන් ම සිදු වන සිද්ධීන් සංඛ්‍යාවට වඩා බොහෝ සෙයින් අඩු විය හැකි බව අවධානයට ගැනීම වැදගත් වේ.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සහ ශ්‍රී ලංකාවේ ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයක ලෝක සෞඛ්‍ය සංවිධානයෙහි වාර්තාව මගින් අවධානය යොමු කර තිබූ කරුණු තහවුරු කෙරෙන තොරතුරු ඉදිරිපත් කර තිබුණි. [3]ජාතික ළමාරක්ෂක අධිකාරියේ අංක 1929 ළමා උපකාරක සේවාව වෙත ලැබෙන පැමිණිලි සංඛ්‍යාව 2020 මාර්තු 16 - අප්‍රේල් 7 අතරතුර කාලයේ දී 40% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති බව එහි සඳහන් වේ. එම කාලය තුළ ලැබුණු පැමිණිලි 292 අතරින් 121 ක් ළමයින්ට එරෙහි කෲරත්වය සම්බන්ධ සිද්ධීන් විය. අපයෝජන සිද්ධීන් පිළිබඳව ආරක්ෂිත ලෙස පැමිණිලි කිරීමට ළමයින්ට හැකියාවක් නොතිබෙනවා විය හැකි වීම හෝ තමන්ට සලකනු ලබන ආකාරය අපයෝජනයක් ලෙස හෝ සුරක්ෂිතබව සහ ආරක්ෂාව සඳහා තමන්ට ඇති අයිතිය උල්ලංඝනය කිරීමක් ලෙස හඳුනාගැනීමට පවා නොහැකි වනවා විය හැකි වීම නිසා කලින් සඳහන් කරන ලද පරිදි, ළමා අපයෝජන සිද්ධීන්වල සැබෑ සංඛ්‍යාව සහ වාර්තා වන සිද්ධීන් සංඛ්‍යාව වෙනස්

වීමට, නැතහොත් බොහෝ සෙයින් ඉහළ සංඛ්‍යාවක් වීමට ඉඩ තිබේ. මහජන සෞඛ්‍යය පිළිබඳ හදිසි තත්වයන් තුළදී (ළමා/ගෘහස්ථ) අපයෝජන සිද්ධීන් වැඩිවන බව පෙන්වා දෙන වර්තමාන පර්යේෂණ මගින් මෙය තහවුරු වෙයි. [4]මාරාන්තික වෛරසයෙන් ආරක්ෂාවී සිටීම සඳහා ලෝකය වසා දමා ඇති අවස්ථාවේ දී, ළමයින්ව සුරක්ෂිතව තබා ගැනීමට තිබෙන ස්ථානය යැයි අපේක්ෂා කරනු ලබන නිවසේ දී ම, ළමයින්ව ආරක්ෂා කිරීමට සිටින්නේ යැයි අපේක්ෂා කරනු ලබන පුද්ගලයින් විසින් ම ළමයින්ව අපයෝජනයට ලක් කරනු ලැබේ.

**කොළඹ පිහිටි පෞද්ගලික රෝහලක මානව සම්පත් කළමනාකරුවෙකුගේ ප්‍රකාශය (පුරුෂ, වයස අවුරුදු 30, පැල්මඩුල්ල)**

*"මෙම වසංගතය හේතුවෙන් මිනිසුන්ගේ දෛනික ජීවන රටාවන් අනපේක්ෂිත ලෙස වෙනස් වෙලා තිබෙනවා. උදාහරණයක් විදියට, පාසල් යන වයසේ ළමයි දැන් පාසල් යන්න නොහැකිවයි ඉන්නෙ. ඔවුන් දැන් ඔවුන්ගේ කාලයෙන් වැඩි කොටසක් නිවසෙහි ම ගතකරමින් 'ඔන්ලයින්' පාඩම්වලට යොමු වී සිටිනවා. එක් පැත්තකින් බැලුවොත්, ඔවුන්ට දෙමව්පියන්ගේ සහ පවුලේ අනෙක් අයගේ ආදරය වැඩියෙන් ලැබෙනවා. ඒත් පාසල් යන වයසේ ළමයින්ට සම වයස් කණ්ඩායම්වල ඇසුර අවශ්‍යයි. ළමයින්ට දැන් ඒ ඇසුර සම්පූර්ණයෙන් ම අහිමි වෙලා. ඒ වගේම, ළමයින්ට ක්‍රීඩා වැනි තවත් බොහෝ සාමූහික ක්‍රියාකාරකම්වල යෙදෙන්නත් බැරිවෙලා තියෙනවා. 'ඔන්ලයින්' ක්‍රමයට ඉගෙන ගන්න එක හරිම වෙනස්; ඒ නිසා ඒක ළමයින් තුළ තිබෙන පීඩනය තවත් වැඩිකරන්න හේතුවෙලා තිබෙනවා."*

ළමයින් යනු වසංගත කාලය අතරතුර දී විශේෂ රැකවරණයක් අවශ්‍ය කරන සහ ලැබිය යුතු කණ්ඩායමක් වේ. වසංගත කාලයක දී ළමයින්ට තම මිතුරන්, ගුරුවරුන් හෝ සමාජයේ තමන්ට විශ්වාසවන්ත සාමාජිකයින් වැනි සාමාන්‍ය තත්වයන් යටතේ දී තමන්ට උපකාර සහ ආරක්ෂාව සපයා දෙන පුද්ගලයින් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව නොලැබේ. වසංගතයෙහි ප්‍රතිඵලයක් ලෙස බිය සහ අනාරක්ෂිතභාවය ඉහළ යාම සහ ජීවනෝපාය අහිමිවීම වැනි තත්වයන් ඇතිවී තිබෙන අතර, ආර්ථිකයෙහි අස්ථාවර බවක් නිර්මාණය කරමින් බොහෝ දුරට එක්රැයක් වැනි කාලයක් තුළ දී සෑම කෙනෙකුගේ ම රැකියා තත්වයන් සහ ජීවන තත්වයන් ද වෙනස් කර ඇත. කෙසේ වෙතත්, මෙම තත්වයන් ළමයින් අපයෝජනය කිරීමේ සිද්ධීන් මෙතරම් තෑතිගන්වනසුළු මට්ටමකින් ඉහළ යාමට බලපෑ හේතූන් පැහැදිලි කරන සාධක ලෙස පෙනෙන්නට තිබුණ ද ඒවා පිළිගත හැකි නිදහසට කරුණු නොවේ. සමාජය තම පැවැත්ම උදෙසා එකිනෙකා මත යැපිය යුතු මෙවැනි කාලයක, සමාජයේ වඩාත්ම අවදානම් සහගත කණ්ඩායම වන ළමයින් අපයෝජනයෙහි වඩාත් ම භයංකර ස්වරූපවලට භාජනය වී තිබේ.

මෙම වසංගතය ළමයින්ව ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීම සහ අපයෝජනයට ලක් කරනු ලැබීම වැඩිවීමට මග පාදා ඇත. වැළැක්වීමේ ක්‍රියාමාර්ග ප්‍රමුඛස්ථානය ගත යුතු අතර, ජීවත්ව සිටින්නන්ට ඔවුන් මුහුණ දී සිටින කම්පනය මැඩපවත්වා ගැනීම සඳහා උපකාර කිරීමට අවශ්‍ය සම්පත් සපයා දිය යුතු වේ. රට පෙර නොවූ විරූ ආකාරයේ ඉහළ මට්ටක අවිනිශ්චිත තත්වයන් සහිත කාලයකට එළඹ ඇත; එහෙත්, ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර බලාත්මක කිරීම සඳහා සැලකිය යුතු මට්ටමක අවධානයක් යොමු කළ යුතු වේ.

## *අධ්‍යාපනය*

*"නූගත්කම සහමුලින් ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවක දී ම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්තා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම"* රාජ්‍යයෙහි එක් අරමුණක් වන බව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(2)(ඌ) වැනි ව්‍යවස්ථාවෙහි සඳහන් කර තිබේ. තවද, ශ්‍රී ලංකාව 1991 වර්ෂයේ දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සම්මත කළ අතර, එම ප්‍රඥප්තියෙහි 28 වැනි වගන්තියට අනුව අධ්‍යාපනය සඳහා සෑම ළමයෙකුට ම ඇති අයිතිය පිළිගෙන තිබේ. මානව අයිතිවාසිකමක් ලෙස මෙන් ම රටෙහි ප්‍රධානතම වගකීමක් ලෙස ද අධ්‍යාපනයෙහි ඇති වැදගත්කම රටෙහි නීතිය මගින් නැවත නැවතත් පිළිගෙන තිබේ.

> **ස්වයං-රැකියාවක නියුතු/දෛනික වැටුප් උපයන ශ්‍රමිකයෙකුගේ ප්‍රකාශය (ස්ත්‍රී, වයස අවුරුදු 49, හිරිපිටියාගම, අනුරාධපුරය)**
>
> *"මගේ පුතාල දෙන්නම පාසල් අධ්‍යාපනය අවසන් කරල ඉන්නේ, ඒත් මගේ දුව තවමත් පාසල් යනවා. ඇය දන් ඉන්නෙ 7 වැනි ශ්‍රේණියේ. මේ වසංගතය නිසා පාසල් වැහුවට පස්සේ ඇයට ඉගෙන ගන්න තිබුණ එකම විකල්ප ක්‍රමය තමයි 'ඔන්ලයින්' අධ්‍යාපනය. නමුත් ඒකට පහසුකම් සලසා දෙන්න අපි බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නා. 'ඔන්ලයින්' අධ්‍යාපනයට අවශ්‍ය මූලික ම දෙයක් තමයි 'ඇන්ඩ්‍රොයිඩ් ෆෝන්' එකක්; ඒත් අපි කාටවත් 'ඇන්ඩ්‍රොයිඩ්' ෆෝන් එකක් තිබුණෙ නැහැ. අපේ මේ දුෂ්කරතා ගැන කවුරුවත් සලකා බැලුවෙත් නැහැ. මේක ගමේ වැඩිදෙනෙකුට තියෙන පොදු ප්‍රශ්නයක්. ගුරුවරු හැම තිස්සෙම කියන්නේ ඔවුන් 'ඔන්ලයින්' පංති කරනවා කියල, ඒත් කවුරුවත් අපේ මේ දුෂ්කරතා ගැන කථා කරන්නේ නැහැ. ඇත්තට ම මගේ දුව මේ අවුරුද්දෙ ඉන්න ඕනැ 8 ශ්‍රේණියේ; ඒත් තවමත් එයාට 7 ශ්‍රේණියේ පාඩම් ටික සම්පූර්ණ කරන්නවත් ක්‍රමයක් නැහැ. කිසිම විභාගයක් නිසි පරිදි පැවැත්වුණෙත් නැහැ. ඒ විතරක් නෙමෙයි, ශිෂ්‍යත්ව විභාගෙට සූදානම් වන 5 ශ්‍රේණියේ ළමයින්ටත්, සාමාන්‍ය පෙළ විභාගෙට ඉන්න 11 ශ්‍රේණියේ ළමයින්ටත්, ඒ වගේම උසස් පෙළ විභාගෙට ඉන්න 13 ශ්‍රේණියේ ළමයින්ටත් මේ ඉතාමත් තීරණාත්මක අධ්‍යාපන සංධිස්ථාන වලට සූදානම් වීමේදී බොහෝ අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා. ඒ අතරින් සමහර ළමයි දන් අධ්‍යාපනය අතහැර දාලා ඉන්නෙ. ඒ විතරක් නෙමෙයි, සමහර ගුරුවරුන්ට තාක්ෂණය පිළිබඳ නිසි දැනුමක් ඇත්තෙත් නැහැ."*

මාර්ගගත (ඔන්ලයින්) අධ්‍යාපනය ලබා දීමට යොමුවීමේ ක්‍රියාමාර්ගය වසංගතයට දක්වන ලද ස්වභාවික ප්‍රතිචාරයක් විය. කෙසේ වෙතත් මෙම ක්‍රියාමාර්ගයට යොමු වීමත් සමග ම ඒ සඳහා ඇති ප්‍රවේශය සම්බන්ධ ගැටළු මාලාවක් ද ඇති විය. ආසියාවේ සහ අඩු ආර්ථික වර්ධනයක් සහිත රටවල (ධකදඉ්ක"දමඑය* තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය :ෂකඞ* සඳහා ඇති ප්‍රවේශය සහ එහි භාවිතය පිළිබඳ ්චෛර ්ජජි සමීක්ෂණ වාර්තාවකට අනුව ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 15 - 56 අතර පුද්ගලයින් ගෙන් 78% ක ප්‍රමාණයකට ජංගමයක් දුරකථන තිබෙන නමුත් ලැප්ටොප් පරිගණක ඇත්තේ 12% ක ප්‍රමාණයකට පමණකි. තවද, අන්තර්ජාල සම්බන්ධතාවය ඇත්තේ 34% ක ප්‍රමාණයකට පමණකි. පාසල් වසා තිබූ කාලය තුළ දී ශිෂ්‍යයින්ගෙන් 60% ට අධික ප්‍රමාණයකට 'ඔන්ලයින්' අධ්‍යාපනය සඳහා ප්‍රවේශය නොලැබුණු බවට ලංකා ගුරු සංගමයේ මහ ලේකම් ජෝශප් ස්ටාලින් සිදු කළ ප්‍රකාශය මගින් මෙම කරුණ අවධාරණය කරන ලදී. 'ඔන්ලයින්' අධ්‍යාපනය ලැබීම සඳහා අන්තර්ජාලයට සම්බන්ධ වීම පිණිස ළමයින්ට ගස් උඩට, ගල් මතට සහ ගස් උඩ සාදා ගත් පැල්වලට නැග සිටීමට සිදු වූ අවස්ථා දක්වෙන ඡායාරූප පළ වී තිබුණි. තාක්ෂණය සහ අන්තර්ජාලය වෙත ප්‍රවේශය ඇති අය සහ, එම ප්‍රවේශය අවශ්‍ය කරන, එහෙත් එය නොමැති අය අතර විශාල ඩිජිටල් බෙදීමක් පවතියි.

මෙම කාලය තුළ දී ළමයින්ට ලැබෙන අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය පිළිබඳව ද ගැටළු තිබේ. 2020 වර්ෂයේ දී, ළමයින් සමග සටහන් බෙදා ගැනීම සඳහා 'දදප සහ එසජරදිදඑෙ ඔ්පි වැනි තාක්ෂණයන් යොදා ගත්තේ ගුරුවරුන්ගෙන් 4% ක් පමණක් බව ද, 41% ක් දෙනා උය්ඊචව සහ ඩසඉැර වැනි තාක්ෂණයන් තෝරා ගත් බව ද ආසියානු සංවර්ධන බැංකුවෙහි වැඩසටහනක් වන ෑඩැකදචපැබඑ"ස්

සංවිධානය විසින් පළ කරන ලද ලිපියක් මගින් පෙන්වා දෙයි. සෑම ළමයෙකුට ම එක සමාන ගුණාත්මකභාවයකින් යුතු අධ්‍යාපනයක් ලබා දීම සම්බන්ධයෙන් තිබෙන අභියෝග මෙයින් පෙන්නුම් කරයි. සමහර ළමයින්ට ගුරුවරුන්ගෙන් ලැබෙන සන්නිවේදනය එක් දිශාවකට පමණක් සිදු කෙරෙන සන්නිවේදනයක් වන බැවින් එයට ළමයින්ව පෙළඹවීමට හෝ අභිප්‍රේරණය කිරීමට නොහැකි විය හැක.

රජයේ පාසල්වල ගුරුවරුන් මෑත කාලයේ දී දියත් කරන ලද වැඩ වර්ජන හේතුවෙන් ළමයින්ට අධ්‍යාපනය වෙත ඇති ප්‍රවේශය සම්බන්ධයෙන් තිබූ ගැටළුව තවදුරටත් සංකීර්ණ වී තිබේ. එම වැඩ වර්ජනයෙන් පසුව, උසස් අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම සඳහා හමුදා විද්‍යාපීඨයකට අවසර ලබා දීමට රජය විසින් ගනු ලැබූ තීරණයකට එරෙහිව විරෝධත දැක්වූ වෘත්තීය සමිති සාමාජිකයින් 22 දෙනෙකු අත්අඩංගුවට ගෙන නිරෝධායනයට යොමු කරන ලදී. දින නියමයක් නොමැතිව වැඩ වර්ජනයෙහි නියැළීමට සහ 'ඔන්ලයින්' ඉගැන්වීම් වලින් ඉවත් වීමට ගනු ලැබූ තීරණය හේතුවෙන් ළමයින් තව තවත් වැඩි සංඛ්‍යාවකට කවර හෝ ආකාරයක අධ්‍යාපනයකට ප්‍රවේශයක් නොමැති විය.

මෙම අවහිරතාවන් සහ මූලික අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීමට ඇති දුෂ්කරතාවයන් ද පාසල් නැවත ආරම්භ වූ විට නැවත පාසල් නොගොස් සිටීමට ළමයින්ව පෙළඹවීමට ඉඩ තිබේ. විශේෂයෙන් ම අඩු ආදායම් තත්වයන් සහිත පවුල්වල ළමයින්ට තම පවුල සඳහා අමතර ආදායමක් උපයා දීම පිණිස රැකියා වල නිරත වීමට හෝ රැකවරණය සපයන්නන් වැනි කාර්යයන් ඉටු කිරීමට සිදුවී තිබෙන බැවින් ඔවුන්ට නැවතත් දිනපතා පාසල් යාමේ දිනචර්යාවට හුරු වීම වඩාත් දුෂ්කර කාර්යයක් විය හැක. ළමයින් පාසල් පද්ධතියෙන් ගිලිහීමේ අනුපාතය ඉහළ යාමට ඉඩ තිබේ.

## සෞඛ්‍යය සහ පෝෂණය

ශ්‍රී ලංකාව ළමයින්ට යහපත් පෝෂණයක් සපයා දීම සඳහා සැමවිටම බලවත් පරිශ්‍රමයක් දරමින් සිටි රටක් වන අතර, කෝවිඩ්-19 වසංගතය මගින් එම තත්වය තව තවත් උග්‍ර කර තිබේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනවිකාස සහ සෞඛ්‍ය සමීක්ෂණවලට අනුව, පසුගිය කාලය තුළ වයස අවුරුදු 5 ට අඩු ළමයින්ගේ පෝෂණ මට්ටමෙහි වර්ධනයක් සිදු වී නැත. වයස අවුරුදු 5 ට අඩු ළමයින් අතරින් අඩු බර සහිත ළමයින්ගේ ප්‍රතිශතය 2006/07 වර්ෂයේ දී 21% ක් ව පැවති අතර එය 2016 වර්ෂය වන විට 20.5% ක් දක්වා වූ ඉතා සුළු ප්‍රමාණයකින් පමණක් අඩු වී ඇති බව 2016 වර්ෂයේ නවතම දත්ත වලින් පෙන්වා දෙයි. තවද, වයස අවුරුදු 5 ට අඩු ළමයින් ගෙන් 17% ක් අඩු වර්ධනයක් සහිත ළමයින් වන අතර, 21% ක් අඩු බර සහිත ළමයින් ද, 15% ක් උසට සාපේක්ෂව කෙසඟ ළමයින් ද වෙති. වසංගතය හේතුවෙන් පවුල්වල ආදායම් අහිමි වීමත්, උද්දමනය හේතුවෙන් භාණ්ඩවල මිල ඉහළ යාමත් නිසා ළමයින්ට තවදුරටත් නිසි පෝෂණය අහිමි විය හැකි අතර, වඩාත් දිළිඳු ප්‍රජාවන්ට මෙම තත්වය ප්‍රමාණානුකූල නොවන ලෙස බලපානු ඇත. මුල් ළමා විය කාලය තුළ දී අඩු පෝෂණය ළමයින්ගේ මානසික සහ ශාරීරික වර්ධනයට අහිතකර ලෙස බලපානු ඇත.

පාසල් වසා දැමීමත් සමග මිලියන 1.1කට අධික සිසුන් සංඛ්‍යාවකට පාසලෙන් නොමිලයේ ලැබෙන දිවා ආහාරය නොලැබීම ළමයින්ගේ පෝෂණය සම්බන්ධයෙන් ඇති අභියෝග තවදුරටත් උත්සන්න කිරීමට හේතුවක් වී තිබේ. බොහෝ විට මෙම ආහාර වේල ඔවුන්ගේ ප්‍රධානතම පෝෂණ මූලාශ්‍රය වන අතර, එය තම ළමයින් පාසල් යන බව සහතික කිරීම සඳහා ආන්තික ප්‍රජාවන් දිරිගන්වන්නක් ද වෙයි.

කොළඹ පිහිටි පෞද්ගලික සමාගමක බෙදාහැරීම් කළමනාකරුවෙකුගේ ප්‍රකාශය (පුරුෂ, වයස අවුරුදු 34, බණ්ඩාරවෙල)

*"මගේ අයියගේ පුතා පාසල් යන්න පටන් ගත්තේ 2019 අවුරුද්දෙ. දැන් එයා ඉන්නේ 2 ශ්‍රේණියේ. එයාලට මගහැරුණු දේවල් බොහොමයක් තිබෙනවා. එයාලට ප්‍රායෝගික දැනුම නැහැ. ඒ විතරක් නෙමෙයි, ළමයින්ගේ හැසිරීම් ඉතාමත් සෘණාත්මක ආකාරයකට වෙනස්වෙලා. අපි තාක්ෂණයෙන් සහ තවත් බොහෝ දේවල් වලින් දියුණු විය යුතුයි. නමුත් අපි අනෙකුත් අහිතකර බලපෑම්වලටත් විසඳුම් සොයා ගත යුතුයි. ඒක ඉතාමත් වැදගත් දෙයක්."*

අනෙකුත් ළමයින් සමග සමාජමය වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාකිරීමක් නොතිබීම සහ ඒ සමගම, මාර්ගගත මෙවලම් භාවිතය වැඩිවීම ළමයින් තුළ ඇති පීඩනය වැඩිවීමට සහ මානසික සෞඛ්‍ය ගැටළු ඇතිවීමට හේතුවී තිබේ. බොහෝ ළමයින් තාක්ෂණයට ඇබ්බැහිවී සිටින අතර, ඔවුන් අන්තර්ජාල ක්‍රීඩා වලට වැඩි කාලයක් ගත කිරීම නිසා ශාරීරික ව්‍යායාම සිදු කිරීමක් හෝ ඔවුන්ගේ චාලක කුසලතා භාවිතා කිරීමක් සිදු නොවෙයි. අන්තර්ජාලය ඔස්සේ පැවති සම්මන්ත්‍රණයක (වෙබිනාර්) දී මේ පිළිබඳ අදහස් දැක්වූ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය කාලිංග සිල්වා මෙසේ සඳහන් කළේය: "ළමයින් මේ වන විට දුරකථනය ඔස්සේ සිදු කරන ක්‍රීඩා වලට ඇබ්බැහි වී සිටිති. මිනිසුන් දැඩි පීඩනයකින් පෙළෙති." ඔවුන් තිරය ඉදිරියේ ගත කරන කාලය සීඝ්‍රයෙන් වැඩිවී ඇති අතර, එය ඒ ආශ්‍රිත වූ ගැටළු ගණනාවක් නිර්මාණය කර තිබේ.

## *සමාප්තිය*

කෝවිඩ්-19 වසංගත කාලය තුළ දී ළමයින්ට සහ කාන්තාවන්ට එරෙහිව සිදු වන ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා ගෙන ඇති ප්‍රජා ක්‍රියාමාර්ග ගණනාවක් තිබේ. ගෘහස්තව සිදු වන හිංසනය අවම කිරීම සඳහා ප්‍රගාමී කාර්යභාරයක් ඉටු කිරීම පිණිස ආගමික නායකයින් යොදා ගැනීම වැනි ක්‍රියාමාර්ග මෙයට ඇතුළත් වේ. [5]වසංගතය මගින් සමාජය කෙරෙහි ඇති කරනු ලබන හානිකර බලපෑම අවම කිරීම සඳහා රජය සහ ප්‍රජාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අගය කිරීමට ලක් කළ යුතු අතර ම, මෙම අවස්ථාවේ දී ළමයින් සහ පවුල් මුහුණ දී සිටින, සැඟවී ඇති බරපතල ගැටළු රාශියෙහි මතුපිට පමණක් අපිට දර්ශනය වෙයි. වසංගත කාලය තුළ දී ළමයින්ට එරෙහිව සිදු වන ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ එයට ප්‍රතිචාර දැක්වීම සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කරන ලද රටවල් වූ නවසීලන්තය සහ සිංගප්පූරුව වැනි රටවලින් ඉගෙන ගත හැකි වැදගත් උදාහරණ සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවට ද ළමයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින අවදානම් අවම කිරීම සඳහා තවත් බොහෝ දේ සිදු කළ හැක.

ශ්‍රී ලංකාවට ද පහත සඳහන් කරුණු ඇතුළත් උපායමාර්ගික සැලසුම් අවශ්‍ය කරයි:

- පෙරසූදානම් සහ අවදානම් අවම කිරීමේ උපාය මාර්ගවලට දායක වන බහුවිධ අංශ (සෞඛ්‍ය, අධ්‍යාපන සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශ, සමාජ සේවකයින් වැනි) සහ සංනිවේදන වේදිකා සහභාගීකරවා ගැනීම, සහ මෙම ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කර දීම.
- ප්‍රචණ්ඩත්වයෙහි බලපෑමට ලක්වන පුද්ගලයින් සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ඇතුළත් වන වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන් සහ සේවා සැලසුම් කිරීම:
- මානසික සෞඛ්‍ය, මනෝසමාජයීය සහාය සහ ආරක්ෂණ සේවා;
- මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමේ වැඩසටහන්, උපදේශන සේවා, සහ ස්ත්‍රී දූෂණවලට ලක්වූවන්ට ක්ෂණික රැකවරණ සේවා සැපයීම ඇතුළු වෛද්‍ය ප්‍රතිකාර සැපයීම;

- සියලුම අත්‍යාවශ්‍ය සේවකයින් සඳහා වැටුප් සහිත අසනීප, වෛද්‍ය, පවුල් නිවාඩු සහ දැරිය හැකි මිලකට ළමා රැකවරණ සේවා සපයා දීම;
- වසංගත කාලය තුළ දී ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ අපයෝජන සිදුවීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ එයට ප්‍රතිචාර දැක්වීම සඳහා සේවා ක්‍රියාත්මකව තිබීම හෝ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවී බේරී සිටින්නන්ට ස්වයං-උපකාර සැලසීම හෝ සමානයින්ගේ සහාය කණ්ඩායම් සූදානම් කිරීම.
- මහජනතාවට ලබා දෙනු ලබන තොරතුරු ගුවන් විදුලිය, රූපවාහිනිය සහ අන්තර්ජාලය ඔස්සේ සහ සිල්ලර කඩ හෝ ඖෂධ වෙළඳසැල්වල පෝස්ටර් හො දැන්වීම් ප්‍රදර්ශනය කිරීම හේ අත්පත්‍රිකා බෙදා දීම වැනි ක්‍රම ඔස්සේ සිදු කළ හැක. එම සන්නිවේදනයන්ට ජාතික භාෂා තුනෙන් ම ප්‍රවේශ විය හැකි විය යුතු අතර, ශ්‍රව්‍ය හා දෘශ්‍ය ආබාධ සහිත පුද්ගලයින්ට ද ප්‍රවේශ විය හැකි ස්වරූප වලින් තිබිය යුතුය.
- ප්‍රචණ්ඩත්වය හෝ අපයෝජනය ඇඟවෙන සලකුණු පිළිබඳව තැපැල් ලිපි බෙදාහරින්නන්, මනු කියවන්නන්, හදිසි අවස්ථා වලදී පළමු ප්‍රතිචාර දක්වන්නන්, සහ ආහාර බෙදා හැරීමේ සේවාවල සාමාජිකයින් වැනි අත්‍යාවශ්‍ය සේවා සපයන්නන් පරීක්ෂාකාරී කරවීම සහ දිවි බේරාගෙන සිටින්නන්ට උපකාර අවශ්‍ය වුවහොත් කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම.
- මත්පැන් භාවිතය, අවි ආයුධ, මත්ද්‍රව්‍ය භාවිතය, සහ අනෙකුත් ඇබ්බැහිවීමේ චර්යාවන් මගින් සිදුවිය හැකි හානි ද ඇතුළුව ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීමට සහ අඩුකර ගැනීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් පුහුණු කිරීම;
- ප්‍රචණ්ඩත්වයෙන් බේරීම සඳහා ආරක්ෂිතව නිවසින් පිටව යාමට උපකාර අපේක්ෂා කරන පුද්ගලයින්ට ප්‍රදේශ වසා දමා තිබියදී වුව ද එසේ පිටව යාමට අවශ්‍ය විධිවිධාන සැලසීම;
- දැනට තිබෙන උපකාරක සේවා ක්‍රියාත්මකව තැබීම හෝ සාමාන්‍ය දුරකථන ඇමතුම්, ටෙක්ස්ට් පණිවුඩ, චැට් කිරීම හෝ මගහැරුණු ඇමතුම් (මිස්ඩ් කෝල්) ඇතුළු නව උපකාරක සේවා ස්ථාපනය කිරීම සහ නොමිලයේ දුරස්ථ ක්‍රමයට රෝග පරීක්ෂාකර ඖෂධ සපයා දීම, සහ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවාගන්නා සියලු දෙනාට එම සේවා වෙත ප්‍රවේශය තිබෙන බව සහතික කිරීම;
- ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා අපරාධ යුක්ති පද්ධතිය, සෞඛ්‍ය, සමාජ සේවා, සහ සිවිල් සමාජ සංවිධාන ඇතුළත් වන බහු-ආංශික සහයෝගීත්වයක් ස්ථාපිත කිරීම;
- වසාතැබීමේ හෝ නිරෝධායන කාලපරිච්ඡේද තුළ දී රැකවරණය සපයන්නන්ට ළමයින් හදාවඩා ගැනීම පිළිබඳව සහ ආතතිය හා මානසික පීඩනය අඩුකර ගැනීමේ ක්‍රම පිළිබඳව උපදෙස් සපයා දීම, ධනාත්මකව මැඩපවත්වා ගැනීමේ උපාය මාර්ග, සමාජ සහාය, සුරක්ෂිතතා සැලසුම්කරණය පිළිබඳව සහ දුම්කොළ, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතය වළක්වා ගැනීමේ ක්‍රම පිළිබඳව උපදෙස් සපයා දීම.

ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ බලාත්මක කිරීම විශේෂයෙන් ම මෙම වසංගත කාලය තුළ දී පරම වැදගත්කමකින් යුක්ත වේ. වසංගතයෙහි අහිතකර බලපෑම් සමාජයේ මුළු මහත් සමාජ ආර්ථික පරාසයට ම අයත් ළමයින්ට ප්‍රමාණානුකූල නොවන ආකාර වලින් බලපාන බව සියලු පර්යේෂණ වලින් සහ ලබාගැනීමට තිබෙන සහ ඉදිරිපත්වී තිබෙන ආනුභවික දත්ත වලින් පැහැදිලි වෙයි. ආසාදනය විය යුත්තේ කවුරුන්ද යන්න සම්බන්ධයෙන් වෛරසය විසින් කිසිදු වෙනස්කොට සැලකීමක් නොකරන නමුත්, එහි අහිතකර බලපෑම් විවිධ ප්‍රජාවන් අතර බෙදී යන ආකාරය පුළුල් ලෙස වෙනස් වෙයි.

සමාජයේ දැනට පවතින අසමානත්වයන් සහ අවදානම්සහගතභාවයන් කොවිඩ්-19 වසංගතය විසින් තවදුරටත් පුළුල් කර තිබේ. සියලු ම ළමයින් වසංගතයෙහි බලපෑමට ලක්වී සිටින නමුත්, සමහර ළමයින් කණ්ඩායම්වල මූලික සහ වඩාත් ම අත්‍යාවශ්‍ය ම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති අතර, මෙම තත්වය ඔවුන්ට ලැබීමට ඇති අනාගත අවස්ථාවන්ට අහිතකර ලෙස බලපායි. ළමයින් ශ්‍රී ලංකාව සතු වඩාත්ම වටිනා සම්පත වන බැවින් ශ්‍රී ලංකාවේ අනාගත පරම්පරාවන් ආරක්ෂා කර ගැනීම සඳහා තවත් බොහෝ දේ කළ යුතු වේ.

## මූලාශ්‍ර

[1] Phakathi, Mantoe. Report Shows Sri Lanka has Escalation of Violence during COVID-19 Lockdown.IPS [Internet]. Available at http://www.ipsnews.net/2020/08/report-shows-sri-lanka-escalation-violence-covid-19-lockdown/

[2] 5891 child abuse cases reported from 2012 – 2020. News 1st [Internet]. Available at https://www.newsfirst.lk/2020/02/11/5891-child-abuse-cases-reported-from-2012-2020/

[3] UNICEF And NCPA Gravely Concerned By Increase In Proportion Of Child Cruelty Cases Reported to NCPA Hotline Since The Start Of The Covid-19 Curfew. UNICEF [Internet]. Available at https://www.unicef.org/srilanka/press-releases/unicef-and-ncpa-gravely-concerned-increase-proportion-child-cruelty-cases-reported

[4] Violence against children and adolescents in the time of COVID-19, United Nations ECLAC [Internet], December 2000, Available At https://www.cepal.org/en/publications/46486-violence-against-children-and-adolescents-time-covid-19

[5] Faith leaders join together to protect children during COVID-19, End Violence Against Children [Internet],14th April 2020, Available At https://www.end-violence.org/articles/faith-leaders-join-together-protect-children-during-covid-19

## පරිශීලන ග්‍රන්ථ


Social Policy and Child Rights Monitoring.UNICEF[Internet]. Available at https://www.unicef.org/srilanka/social-policy-and-child-rights-monitoring

COVID-19 and Children's Rights.OHCHR.[Internet].Available at https://ohchr.org/EN/Issues/Children-OHCHR/Pages/COVID19Children.aspx

UN Advisory paper:Immediate Social Economic Response to COVID 19 in Sri Lanka, UN sustainable development group [Internet]. July 2000, Available at https://unsdg.un.org/resources/un-advisory-paper-immediate-socio-economic-response-covid-19-sri-lanka

The Situation of Children in Sri Lanka. UNICEF [Internet] 2021, Available at https://www.unicef.org/srilanka/situation-children-sri-lanka

The Impact of Covid-19 on Women and Girls with Disabilities: A global assessment and case studies on sexual and reproductive health and rights, gender-based violence, and related rights,Save the Children [internet] 2021. Available At: https://resourcecentre.savethechildren.net/library/hidden-impact-covid-19-children-global-research-series

COVID-19 and Burden of Child Under-nutrition in Sri Lanka. Daily Mirror [Internet]. July 2, 2021, Available at https://www.dailymirror.lk/editorialbusiness/COVID-19-and-burden-of-child-undernutrition-in-Sri-Lanka/340-215245

Children Fall Prey to the Invisible Pandemic. Daily Mirror [Internet]. Dec 25, 2020, Available at https://www.dailymirror.lk/medicine/Children-fall-prey-to-the-Invisible-Pandemic/308-202512

New Births Decrease due to COVID: Indigenous Medicine State Minister. Daily Mirror [Internet]. July 16, 2021, Available at https://www.dailymirror.lk/latest_news/New-births-decrease-due-to-COVID-Indigenous-Medicine-State-Minister/342-216284

Beating 'Pandemic Depression.' Daily Mirror [Internet].July 16,2021, Available at https://www.dailymirror.lk/medicine/Beating-Pandemic-Depression/308-216250

Global Status Report on Preventing Violence against Children 2020.WHO [Internet],Available at https://www.who.int/teams/social-determinants-of-health/violence-prevention/global-status-report-on-violence-against-children-2020

5891 Child Abuse Cases Reported from 2012 – 2020. News 1st [Internet]. Feb 11, 2020, Available at https://www.newsfirst.lk/2020/02/11/5891-child-abuse-cases-reported-from-2012-2020/

http://www.epid.gov.lk/web/images/pdf/wer/2020/vol_47_no_42-english.pdf (website not loading)

UNICEF and NCPA Gravely Concerned By Increase In Proportion Of Child Cruelty Cases Reported To NCPA Hotline Since The Start Of The Covid-19 Curfew. UNICEF [Internet], April 9, 2020, Available at https://www.unicef.org/srilanka/press-releases/unicef-and-ncpa-gravely-concerned-increase-proportion-child-cruelty-cases-reported

https://drive.google.com/file/d/1Mi-htIz1IlY5IaaKlgtW4L61RqTRCtQ0/view?usp=sharing – unable to access

Building a Crisis-Resilient Education System in Sri Lanka. Development Asia [Internet], June 28, 2021, Available at https://development.asia/insight/building-crisis-resilient-education-system-sri-lanka

Sri Lankan children make a dangerous climb for online school. Aljazeera [Internet]. Available At: https://www.aljazeera.com/gallery/2021/7/13/sri-lankan-children-make-a-dangerous-climb-for-online-school

LIRNEasia on access for all, women and work at the inaugural Sri Lanka Internet Day, LIRNEasia [Internet] 12th April 2021. Available At: https://lirneasia.net/2019/05/afteraccess-asia-report3/

Virtual Education, COVID-19 and Dumping of our Children – EDITORIAL. Daily Mirror.[Internet], Feb 1, 2021, Available at https://www.dailymirror.lk/opinion/Virtual-education-CoVID-19-and-dumping-of-our-children-EDITORIAL/172-204847

Internet Penetration Rate in Sri Lanka from 2010 to 2019. Statistica.com. [Internet], Mar 29, 2021, Available at https://www.statista.com/statistics/765516/internet-penetration-rate-sri-lanka/

No Online Education for 60% Students: Teachers. The Morning.[Internet], June 24, 2021, Available at https://www.themorning.lk/no-online-education-for-60-students-teachers/

Nutrition crisis looms as more than 39 billion in-school meals missed since start of pandemic – UNICEF and WFP. UNICEF. [Internet], Feb 1, 2021, Available at https://www.unicef.org/srilanka/press-releases/nutrition-crisis-looms-more-39-billion-school-meals-missed-start-pandemic-unicef-and